# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - ගාල්ල කොටුව (013) ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020.01.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

බලපිටිය නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ මහත්මිය විසින් 2017.10.16 දින ලියා සහතික කරන ලද අංක 12868 දරන උකස්කරය මත ද, එකී නොතාරිස් මහත්මිය විසින් 2017.11.27 දින ලියා සහතික කළ අංක 12944 දරන උකස්කරය මත ද, ගාල්ල නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජී. ජී. අයි. ගුණරත්න මහත්මිය විසින් 2018.08.31 දින ලියා සහතික කළ අංක 7932 සහ 7933 දරන උකස්කර මත ද, බලපිටිය නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ මහත්මිය විසින් 2018.03.13 දින සහතික කළ අංක 13128 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද ගාල්ල මහමෝදර, කොළඹ පාර, අංක 226 හි ප්‍රධාන කාර්යාලය පිහිටි ලියාපදිංචි අංක PV 121455 දරන ඩිසෙන්රෝ රිසෝට්ස් (පුද්ගලික) සමගාම විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ දැනට රුපියල් එක්කෝටි හැත්තෑ ලක්ෂ පනස් දෙදහස් හයසිය තිස් එකයි ශත හැට දෙක (රු. 17,052,631.62) ක මුදලක් ද, රුපියල් හතලිස් අටලක්ෂ හැටඅට දහස් හාරසිය විසි එකයි ශත අට (රු. 4,868,421.08) ක මුදලක් ද, රුපියල් තිස්හතර ලක්ෂ දෙළොස් දහස් පන්සීයයි ශත දෙක (රු. 3,412,500.02) ක මුදලක් ද, දහතර ලක්ෂ අසූහත් දහස් පන්සිය (රු. 1,487,500) ක මුදලක් සහ රුපියල් අසූපන් ලක්ෂය (රු. 8,500,000) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඉඩ ඇති බැවින් ද, 2018.10.18 දින සිට වර්ෂයකට සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතියක (AWPLR) +8.5% (අවම පොළී අනුපාතිකය 13%ක් මත) බැගින් රුපියල් එක්කෝටි හැත්තෑ ලක්ෂ පනස් දෙදහස් හයසිය තිස් එකයි ශත හැට දෙක (රු. 17,052,631.62) ක මුදලක් ද, 2018.09.29 දින සිට වර්ෂයකට සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය ((AWPLR) +8.5%) (අවම පොළී අනුපාතිකය 13%ක් මත) බැගින් රුපියල් හතලිස් අට ලක්ෂ හැට අට දහස් හාරසිය විසිඑකයි ශත අට (රු. 4,868,421.08) ක මුදලක් ද, 2018.12.01 දින සිට වර්ෂයකට සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය ((AWPLR) +8.5%) (අවම පොළී අනුපාතිකය 13%ක් මත) බැගින් රුපියල් තිස්හතර ලක්ෂ දෙළොස් දහස් පන්සීය ශත දෙක (රු. 3,412,500.02) ක මුදලක් ද, 2018.01.01 දින සිට වර්ෂයකට සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය ((AWPLR) +8.5%) (අවම පොළී අනුපාතිකය 13%ක් මත) බැගින් දහර ලක්ෂ අසූහත් දහස් පන්සිය (රු. 1,487,500) ක මුදලක් සහ 2018.11.01 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් අසූපන් ලක්ෂයක (රු. 8,500,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29L (29එල්) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්කෝටි හැත්තෑ ලක්ෂ පනස් දෙදහස් හයසිය තිස් එකයි ශත හැට දෙක (රු. 17,052,631.62) ක මුදලක්, රුපියල් හතලිස් අට ලක්ෂ හැටඅට දහස් හාරසිය විසි එකයි ශත අට (රු. 4,868,42.08) ක මුදලක්, රුපියල් තිස්හතර ලක්ෂ දෙළොස් දහස් පන්සීයය ශත දෙක (රු. 3,412,500.02) ක මුදලක්, දාහතර ලක්ෂ අසූහත් දහස් පන්සීය (රු. 1,487,500) ක මුදලක් සහ රුපියල් අසූපන් ලක්ෂය (රු. 8,500,000) ක මුදලක් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර එරන්දතී සමන්මලී රාමනායක විසින් එකී අංක 12868, 12944, 7932, 7933 සහ 13128 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

01. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාළු කඩවත් සතර තුළ ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාළු මහ නගර සභා සීමාවේ, 226 මහමෝදර ග්‍රාම නිලධාරී වසමේ, මහමෝදර පිහිටි "ප්‍රංශ කාරයාගෙවත්ත හෙවත් කින්නතම්බිගෙ වත්ත" නැමති ඉඩමේ ඒ අක්ෂරය දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු එස්. ජී. වීරසූරිය මහතා විසින් 2013.10.06 දින මැන සාදන ලද සහ 2013.10.08 දි සහතික කරන ලද අංක 40/2013 දරන පිඹුර ප්‍රකාරව බෙදූ ඒ 3 දරන කැබැල්ලට මායිම්, උතුරට : වරිපනම් අංක 228/2 දරන මෙම ඉඩමේම කොටසක් සහ මෙම ඉඩමේම ඒ [1] දරන කැබැල්ල ද, නැගෙනහිරට : වරිපනම් අංක 220/2 දරන මෙම ඉඩමේම කොටසක් මෙම ඉඩමේම ඒ [2] දරන කැබැල්ල සහ වරිපනම් අංක 224 දරන මෙම ඉඩමේම කොටසක් ද, දකුණට : මෙම ඉඩමේ ඒ [5] දරන කැබැල්ල ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් ඒ [4] දරන කැබැල්ල සහ වරිපනම් අංක 228/2 දරන මෙම ඉඩමේ කොටසක් ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතයි දශම පහ (පර්. 17.5) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද වේ.

මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක Q 188/138 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව.
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

12 - 05

